29 වන පිටුවෙන් (වේවැල් ....)

හෝ බැලීම මහා මදිකමක් වුණා.

ඒක එහෙම වුණාත් ඈ ඔහු කෙරෙහි බැඳගත් ආදරය තව තවත් වැඩුණා මිස අඩුවීමක් නම් වුණේ නෑ.

මට ඈ මෙහෙමත් කිව්වා..

'ඔහු මේ මහ පොළොව මත මා දැක්ක එක ම මනුෂ්‍යයා' දොස්තර මහත්තෙයො මට වැටහුණේ නෑ තවත් මිනිස්සු හිටියද කියලවත්.

අන්තිමේ ඇගේ දෙමාපියෝ මිය ගියා ඈ ඔවුන්ගෙ රැකියාව පටන්ගත්තා. හිටිය එක බල්ලා වෙනුවට බල්ලෝ දෙන්නෙක් ම ගත්ත. භයානක බල්ලෝ දෙන්නෙක්. ඒ හින්දා ම කවුරුවත් ඈ වෙතට කිට්ටු වෙන්ඩ බයවුණා.

එක දවසක් ඈ තම හදවත නවාතැන් ගෙන තිබෙන ගමට පැමිණි අවස්ථාවක ෂුකේගෙ සාප්පුවෙ ඉඳල තම පෙම්වතාගෙ අතේ එල්ලීගෙන එළියට එමින් සිටි තරුණ කාන්තාවක් දැක්කා.

ඒ ඔහුගේ භාර්යාවය ෂුකේ විවාහ වෙලා.

එම රාත්‍රියේ ම ඈ නගර සභාව අසල තිබුණු පොකුණට පැන්නා. ඒක දැකපු බේබද්දෙක් ඈ ගොඩට ගෙනාවා. එහෙම ගෙනැල්ල ෂුකේ මහත්තෙයගෙ ඔසුසල වෙත අරගෙන ආවා. ෂුකේ පුත්‍රයා තම රාත්‍රී ඇඳුම පිටින් ම ඈ සුවපත් කරන්නට ආවා. ඈව හඳුනාගත් බවක් නො පෙන් වු ඔහු ඇගේ ඇඳුම් උනා ඇගේ සිරුර උණුසුම් කළා. අනතුරුව දැඩි ස්වරයකින්:

'උඹට පිස්සු වැහිල! මේ වාගෙ මෝඩ වැඩ කරගන්ඩ එපා' කියල කිව්ව.

එම වචන කීපය ම ඇය සුවපත් කිරීමට ප්‍රමාණවත් වුණා. එයින් ඈ දිගුකළක් සතුටින් පසුවුණා. ඈ ප්‍රතිකාර සඳහා මිළ ගෙවීමට තැත්කළත් ඔහු සතයක්වත් ඒ සඳහා අය කළේ නෑ. ඇගේ මුළු ජිවිතයම ඒ ආකාරයට ගෙවුණා. ඈ වේවැල් වියුවේ ෂුකේ ගැන සිහින මවමින් හැම අවුරුද්දක ම සාප්පුවෙ වීදුරු වලට පසුපසින් ඈ ඔහුගෙ රුව දැකගත්තා. පුරුද්දක් වශයෙන් ඈ බෙහෙත් වර්ග මිළදී ගත්තේ ද එම සාප්පුවෙන් මයි. එසේ කිරීම තුළින් ඈට ඔහු ඉතා ළඟින් ම දැකගන්නට ඉඩ ප්‍රස්තාව ලැබුණු අතර ම ඔහු සමග කතා කිරීමටත් ඔහුට තව තවත් මුදල් දීමටත් අවස්ථාව පෑදුනා.

ආරම්භයේදී මා ඔබට කී පරිදි පසුගිය වසන්තයේ දී ඈ මියගියා. මෙම ඛේදජනක කතාන්තරය කියා අවසන් කළ ඈ නිසි ආහාරයක් හෝ නො ගෙන කුසගින්නේ පවා ඉඳිමින් ඉතිරි කරමින්, ඈ මියගිය පසු ඔහුට ඈ ගැන අඩුතරමින් එක්වරක් වත් කල්පනා වේවායි පතාගෙන වැඩ කරමින් එසේ ඇගේ මුළු ජිවිත කාලය තුළ ම ඉතිරි කළ ධනය ඈ මුළු හදින් ම ඉවසීමෙන් යුතුව ආදරය කළ ඒ පුද්ගලයාට බාරදෙන්නැයි කියා මගෙන් ඉල්ලා සිටියා. ඈ එලෙසින් මා වෙත පැවරූ මුළු මුදල ප්‍රැංකු දෙදහස් තුන්සිය විසිහතක් වුණා.

ප්‍රැංකු විසිහත භූමදාන කටයුතු සඳහා ගැනීම පිණිස පියතුමා අතට දුන්න. ඈ තම අවසන් හුස්ම පොද පිට කළාට පස්සෙ මම ඉතිරි මුදලත් අරගෙන එතැනින් පිටවුණා.

ඊට පහුවදා මම ෂුකේ නිවසට ගියා. උදේ ආහර පිස අවසන් කර සිටි රතු තරබාරු දෙදෙනා ඖෂධ සුගන්ධය නිසා බොහොම තෘප්තියකින් හිටියෙ. මට බීම වීදුරුවක් පිළිගන්වා අසුනක් පෙන්නුවා.

මා මගේ දේශනාව කම්පිත ස්වරයෙන් ආරම්භ කළේ ඔවුන් හඬා වැටෙතියි යන බලාපොරොත්තුව ද ඇතිවයි.

මෙම පාදඩ ගැහැණිය මෙම වේවැල් වියන්නිය විසින් ආදරය කරනු ලැබුහ'යි දැනගත් සැණින් ම ෂුකේ කෝපයෙන් දැවෙන්නට වුණා. ඇය තම කීර්තිය සොරාගත්තාක් මෙන් ද අවංක මිනිසුන් තමා කෙරෙහි තැබූ විශ්වාසය කඩා බිඳ දැම්මාක් මෙන් ද තම ජිවිතයටත් වඩා වටිනා වු ඔහුගේ ගෞරවය කෙළෙසා දැම්මාක් මෙන් ද සලකමින් ඔහු මහත් කෝපයකින් දැවෙන්නට පටන් ගත්තා. ඔහු තරමට ම කෝප වු ඔහුගේ බිරිඳ:

'මේ හිඟන්නි, මේ හිඟන්නි යනුවෙන් සුදුසු වචනයක් සොයාගත නොහැකිව එක දිගටම කියාගෙන ගියාය.

මහත් සේ කළබලයට පත් ෂුකේ නැගී හිටියා. ඔහු මේසය පසුපසින් දිග අඩි තබබින් ඇවිදගෙන ගිය අතර ඔහුගේ ග්‍රීක හිස් වැස්ම කණක රැඳී තිබුණා. ඔහු ගොතගසමින් මෙහෙම කිව්ව:

'දොස්තර මහත්තයෝ, මේ කාරණය තේරුම් ගන්න ! මෙන්න මේවා තමා මිනිසුසුන්ට මුණ දෙන්ඩ සිද්ද වෙන හැබෑ ම ඇබැද්දි. මොනව කරන්ඩ ද? ඕකි ජිවතුන් අතර ඉන්නැද්දි මං මේක දැනගත්ත නම් මං ඕකි පොලිසියට කියල හිරේ විලංගුවේ දාල තමයි පස්ස බලන්නේ. හැබැයි ආයෙ බේරිලා ආපහු එන්ඩ එහෙම නොවෙයි. ඔන්න හරිද?

මා බැති සිතින් කළ කාර්යය කෙරෙහි ලැබුණු ප්‍රතිචාරය දුටු මා අන්දුන්කුන්දුන් වුණා.

කළයුත්තේ කුමක්දැයි මට එක්වර ම වටහා ගැනීමත් අපහසු වුණා. එහෙත් මගේ දූත ගමන අවසන් කළයුතු වුණා. එහෙයින් මා නැවත කතාකරන්නට පටන් ගත්තා.

'ඈ ඉතිරි කළ ධනය ඔබට පවරන්නය කියල මගෙන් ඉල්ලීමක් කරල තියෙනව. එම මුදල ප්‍රැංකු දෙදාස් තුන්සියයක්. ඔබ මේ කාරණය දැනගෙන මහත් අප්‍රසාදයක් පළකළ නිසා මා හිතනවා මෙම ධනය දුප්පතුන් වෙත බෙදාදීම වඩා හොඳයි කියල.

මා එසේ කී කල ගැහැණිය සහ මිනිසා බලවත් හැඟීමකින් ග්‍රහණය වී මා දෙස බලා සිටින්ඩ වුණා. මා රන්කාසි වෙනත් කාසි එකට කලවම් වු හැම රටක ම හැම ලකුණ ම සහිත කාසි පොදිය එළියට ගත්තා.

'ඔබ මොකදැ කියන්නෙ ?

ෂුකේ මහත්මිය පළමුවෙන් කතාව පටන්ගත්තා.

'කොහොම උනත් මේක මේ ගෑණිගෙ අවසන් කැමැත්ත නිසා ඒක ප්‍රතික්ෂේප කළ හැකියි කියල මා නම් හිත්නනෙ නෑ.

තරමක් වික්ෂිප්ත වු සැමියා: ඔව් අපට පුළුවන් මේ මුදල් වලින් දරුවන්ට මොනව හරි මිළදී ගන්ඩ'

මා වියළි හඬින් මෙසේ කිව්වා:

ඔව් ඔබේ කැමැත්තක්

ඔහු නැවත කතාව පටන් ගත්තා:

ඔව්, ඇය ඔබට පවරපු වගකීමනෙ. අපට දෙන්න අපි එක යහපත් වැඩකට යොදාගන්ඩ බලනව.

මුදල ඔවුන් වෙත භාරදුන් මා ආපසු ආවා.

පසුදින ෂුකේ මා හමුවට පැමිණ එක්වරම:

"ඒ ගෑණී ඇගේ වාහනෙත් දාලානේ ද ගියේ? ඔබ මොකක්ද ඒකෙන් කරන්ඩ හිතාගෙන ඉන්නෙ?

'නෑ කිසිවක් නෑ. ඔබට එය ඕනැනම් අරන් යන්න.'

'ඔව්, ඒක මට ප්‍රයෝජනවත් වෙනවා. මගේ එළවළු වගාව ආරක්ෂාවට යොදාගන්ඩ පුළුවන්.

ඔහු පිටත්වුණා. මා ඔහුට මෙහෙම කිව්වා. ඒ කාන්තාවගෙ බල්ලො දෙන්නත් අශ්වයන් ඉන්නව. ඔබට උන් ඕනැකරනව ද?'

පුදුමයට පත් හේ නතර වුණා.

'නෑ නෑ මා උන්ගෙන් මොනව කරන්ඩ ද? ඔබට ඕනෑ දෙයක් කරන්න. ඔහු සිනාසී අනතුරුව මට අතට අත දුන්නා.

රටක ඖෂධ වෙළෙන්දාත් වෛද්‍යවරයාත් සතුරන් වී සිටීම නුසුදුය.

මා බල්ලන් දෙදෙනා මා නිවසේ තබාගන්ඩ තීරණය කරගත්තා. ලොකු වත්තක් ඇති බැවින් පියතුමා අශ්වයා රැගෙන ගියා. වාහනය ෂුකේට ආවරණයක් වුණා. ඔහු ඇගේ මුදලින් දුම්රිය කොන්ත්‍රාත්තුවක් ගත්තා.

ඔන්න මගේ ජිවිතයේදී දක්නට ලැබුණු එක ම එමෙන් ම ගැඹුරු ප්‍රේමවෘත්තාන්තය"

වෛද්‍යවරයා නිහඬ විය.

එවිට තම දෙනෙතේ කඳුළු පුරවාගෙන සිටි හාමිනේ මෙහෙම කිව්වා.

හැබෑවට ම ගැහැණු තමයි ආලය කරන්ඩ දන්නේ !

